| Paper No 01 | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2020/21<br>General Certificate of Education (Adv. Level) Examination 2020/21 | | | නව විෂය නිර්දේශය<br>New Syllabus |
| රසායන විද්‍යාව I<br>Chemistry I | 02/ S /I | සැකසුම: **සමීර බාලසූරිය** | මිනි. 20<br>20 min. |

➢ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. $C$, $Ne$, $Mg$, $Si$, $Ar$ සහ $Ca$ පරමාණුවල පළමු අයනීකරණ ශක්තිය වැඩිවන පිළිවෙල වනුයේ
(1) $Mg < Ca < Si < C < Ar < Ne$ (2) $Mg < Ca < Ar < C < Si < Ne$
(3) $Si < C < Ca < Mg < Ne < Ar$ (4) $Ca < Mg < C < Si < Ne < Ar$
(5) $Ca < Mg < Si < C < Ar < Ne$

02. මින් වඩාත් සහසංයුජ වන්නේ,
(1) $MgO$ (2) $MgS$ (3) $Al_2S_3$ (4) $CaO$ (5) $CaS$

03. 7.80 $ppm$ $K^+$ ද්‍රාවණයක 2.00 $dm^3$ සෑදීම සඳහා අවශ්‍ය වන $K_2SO_4.Cr_2(SO_4)_3.24H_2O$ (සාපේක්ෂ අණුක ස්කන්ධය= 894 )හි ස්කන්ධය වනුයේ ($1ppm = 1\ mg\ dm^{-3}$, $Cr = 52.0$)
(1) 8.940 $mg$ (2) 8.940 $g$ (3) 178.8 $mg$ (4) 178.8 $mg$ (5) 89.40 $mg$

04. පරිමාව 500.0 $cm^3$ වන දෘඪ සංවෘත භාජනයක සල්ෆර්, $S_{(s)}$ 0.032 $g$ සමඟ වැඩිපුර ඔක්සිජන් , $O_{2(g)}$ වායුව ඇත. මේවා එකිනෙක ප්‍රතික්‍රියා වීමට ප්‍රථම පද්ධතියේ පීඩනය $2.5 \times 10^5\ Pa$ සහ උෂ්ණත්වය 27 ℃ වේ. $S_{(s)}$ සියල්ල ප්‍රතික්‍රියා කරමින් $SO_2$ වායුමය ඵලය ලබා දෙන ලෙස ප්‍රතික්‍රියාව සිදු කළ පසු 127 ℃ දී පද්ධතියේ අවසාන පීඩනය ආසන්නව,( $S$ හි පරිමාව නොගිනිය හැකි බව හා වෙනස් නොවන බව සලකන්න).($S = 32.0, O = 16.0$)
(1) $0.5 \times 10^4 Pa$ (2) $1.0 \times 10^5\ Pa$ (3) $1.5 \times 10^5\ Pa$
(4) $2.0 \times 10^4\ Pa$ (5) $3.2 \times 10^5\ Pa$

05. $NO_3^-$ අයනයේ හැඩයට සමාන හැඩයක් ඇත්තේ මින් කවරකට ද ?
(1) $NCl_3$ (2) $SO_3^{2-}$ (3) $ClF_3$ (4) $CO_3^{2-}$ (5) $PH_3$

06. $CaCO_3$ අණු(සූත්‍ර ඒකක) 2.40 x $10^{24}$ ක් අඩංගුවන Ca ස්කන්ධය ආසන්න වශයෙන්
(1) 140 g කි (2) 40 g කි (3) 320 g කි (4) 200 g කි (5) 159 g කි

07. ඉහලම ප්‍රථම ඉලෙක්ට්‍රෝනය බන්ධුතා අගයක් ඇත්තේ,
(1) F (2) $O$ (3) $Mg$ (4) $P$ (5) Cl

08. $Na_2CO_3.10H_2O$ හි ස්කන්ධය අනුව $O$ ප්‍රතිශතය වනුයේ,
(1) 66% (2) 73% (3) 30% (4) 80% (5) 40%

09. ක්වොන්ටම් අංක $n < 4, ml = -1$ සහ $ms = +\frac{1}{2}$ වන ලෙස පරමාණුවක තිබිය හැකි උපරිම ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව වන්නේ
(1) 2 (2) 4 (3) 6 (4) 8 (5) 3

10. $Cr_2O_7^{2-}$ අයනයේ Cr හි ඔක්සිකරණ අංකය වනුයේ,
(1) +4 (2) +6 (3) +7 (4) +5 (5) +5